චක්‍රලේඛ අංක 05/2016

සමූපකාර සේවක කොමිෂන් සභාව,
උතුරු පළාත,
18/9 වෛමන් පාර,
නල්ලූර්.
2016.07.20

උතුරු පළාතේ සියළුම සමූපකාර ආයතනවල සභාපතිවරුන් වෙත.

**<u>සමූපකාර සමිති සංවර්ධනය කිරීම සඳහා වන දින 100 වැඩ සටහනේ තාවකාලික කළමණාකරන මට්ටමේ සේවකයින් ස්ථිර කිරීම සඳහා අයදුම් කරන විට සැලකිල්ලට ගතයුතු කරුණු හා කොන්දේසි</u>**

01. තෝරාගනු ලබන සේවකයින් ඔවුන්ගේ සේවා කාලය තුල මනා හැසිරීම් සහිත හොඳ චරිතයෙන් යුත් සේවකයෙකු බව අධ්‍යක්‍ෂක මණ්ඩලය විසින් සහතික කල යුතුය.

02. කලින් ස්ථිර තනතුර සඳහා අනුමැතිය ලබා තිබිය යුතුය.

03. අයදුම් කරන අදාල තනතුරේ වසර පහක් සේවය කර තිබිය යුතුය.

04. අදාල සමිතියේ අදාල තනතුරේ වෙනත් සුදුසුකම් සහිත සේවකයින් නොමැති බව සහතික කල යුතුය.

05. අධ්‍යක්‍ෂක මණ්ඩලය විසින් තෝරා ගනු ලබන අය සමූපකාර සේවක කොමිෂන් සභාව කැඳවූ විට සම්මුඛ පරීක්‍ෂණයට සහභාගි විය යුතුය.

06. සමූපකාර සේවක කොමිෂන් සභාවේ අනුමැතිය ලැබීමෙන් පසු සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ සමූපකාර පුහුණු ආයතනය විසින් පවත්වනු ලබන මාස 06 ක සමූපකාර සේවක සාමාන්‍ය පෙළ පුහුණු පාඨමාලාව සම්පූර්ණ කිරීමෙන් පසු තනතුරේ ස්ථිර කරනු ලැබේ.

07. මෙම පුරප්පාඩුව සඳහා වන විෂය නිර්දේශය.

I. ගණකාධිකරණ 1
II. ගණකාධිකරණ 11
III. කළමණාකරනය
IV. වාණිජ
V. සමූපකරණය
VI. සමූපකාර නීතිය
VII. බද්ධ විෂය ඉංග්‍රිසි
VIII. පරිඝණක

08. සාර්ථකව පුහුණුව අවසන් කිරීමෙන් පසු ස්ථිර පත්වීම පිරිනමා වසර දෙකක පරිවාස කාලය නිශ්චය කරනු ලැබේ. සාර්ථකව පුහුණුව අවසන් කල දිනය ස්ථිර පත්වීම් දිනය වේ.

09. මෙම පරිවාස කාලය තුලදී සමූපකාර සේවක උසස් පෙළ සහතික පත් පුහුණුව නිම කල යුතුය.

2016.07.20 දින කොමිෂන් සභාවේ තීරණය පරිදි.

අත්සන

පී. වාකීසන්,

ලේකම්.

P.VAGESHAN
Secretary
Co-operative Employees Commission
Northern Provincial Council

පිටපත්: 01. ස.සං.කො. උතුරු පළාත.

02. උතුරු පළාත් දියළුම සමූපකාර සංවර්ධන සහකාර කොමසාරිස්වරුන්.